www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කුන්දුස් හි සමූලඝාතන සහ ඉලක්කගත මිනී මැරීමේ පිලිවෙත

## The massacre at Kunduz and the policy of targeted killings

2009 දෙසැම්බර් 28

142ක් පමන දෙනෙකුගේ ජීවිත බිලිගනිමින් සැප්තැම්බර් මුල ඇෆ්ඝනිස්ථානයේ කුන්දුස්හි සිදු වූ සමූලඝාතනය ජර්මානු ජනමාධ්‍ය තුල තවදුරටත් රජයයි. එසේ වුව ද එම සිද්ධියටත් ඉන් පසු දැරුනු සැඟවීමේ වෑයමටත් සැලකිය යුතු මට්ටමක අවධානයක් දෙනු ලැබුවත් 1945න් මෙපිට ජර්මානු අනදෙන්නකු විසින් ඇනවුම් කෙරුනු කුරිරුතම මිලිටරි ප්‍රහාරයෙහි දේශපාලනික, ඓතිහාසික හා ජාත්‍යන්තර ඇඟවුම් පිලිබඳ කිසිවකුදු නොකියවුනු තරම් ය.

මෙසේ සිදු වන්නේ මේ සමූලඝාතනය උපයෝගී කරගනිමින් දෙවන ලෝක යුද්ධයෙහි දී එය සිදු කල අපරාධවල ප්‍රතිඵලයක් හැටියට ජර්මානු මිලිටරියට පනවා තිබෙන සම්බාධකවලින් නිදහස් වීමට මිලිටරි අනදෙන්නන් හා දේශපාලනඥයින් පැහැදිලි ව ම උත්සුක වෙමින් තිබිය දී ම ය.

ජෝර්ජ් ක්ලයින් නමැති එක්තරා ජර්මානු කර්නල්වරයෙක් සැප්තැම්බර් 4 වැනිදා අලුයම පැහැරගනු ලැබූ යුද ටැංකි දෙකක් මතට, ඒ වටා රැස් ව සිටි මිනිසුන් ඝාතනය කිරීමේ අරමුන ඇති ව ගුවන් ප්‍රහාරයක් එල්ල කිරීමට නියෝග කල බව දැන් පිලිගැනේ.

කිලෝමීටර හතක් ඔබ්බෙන් ක්ෂේත්‍ර කඳවුරක සිටි ජර්මානු සොල්දාදුවන්ට ආසන්න අනතුරක් එල්ල ව තිබුනේ නැත. පෙනෙන පරිදි කර්නල් තැන අපේක්ෂා කලේ ජාත්‍යන්තර අත්පත් කරගැනීමේ හමුදාවට එරෙහි වූ දේශීය මිලිෂියාවේ නායකයින් මරා දැමීම යි. තමන් "ගුවන් ප්‍රහාර යොදාගනිමින් කැරලිකරුවන් මුලිනුපුටාදැමීමට" අදහස් කල බව ක්ලෙයින් සිය ඉහල නිලධාරීන්ට ලියූ සටහනකින් පිලිගනියි.

පසුගිය සතියෙහි සංස්කරනයෙහි *ඩර් ස්පීගල්* ඉලක්ක කිහිපයක් නම් කරයි - "පලපුරුදු පෂ්තුන් කමාන්ඩර්වරයකු වූ මුල්ලා ෂම්සුදින්" මෙන් ම "මුල්ලා අබ්දුල් අහ්මාන්, මවුලාවි නයිම්, මුල්ලා සියාහ් සහ මුල්ලා නසරුද්දින් යන තලිබාන් නායකයින් සිව් දෙනා". දෙවනුව කී පිරිස "එක් අයකු සටන්කරුවන් 15 දෙනෙකුට පමන බැගින් අන දීමෙහි යෙදුන කුන්දුස් අවට කුඩා ප්‍රදේශ පාලනය කල ප්‍රාදේශීය නායකයෝ වූහ" යි සඟරාව වාර්තා කරයි.

ඊට පෙර දින කිහිපය තුල අති-රහසිගත කේඑස්කේ ඒකකය මගින් මොවුන් සිටින තැන් සොයා ලුහුබඳිනු ලැබ තිබේ. ප්‍රහාරය සඳහා අන නිකුත් කිරීමට පලමු ක්ලෙයින් අඩු තරමින් එක් කේඑස්කේ සොල්දාදුවකුගෙන් විමසීම් සිදු කොට ඇත.

එසේ කිරීමේ දී - ඔහු සිය ඉහල නිලධාරීන්ට කෙලින් ම කතා කොට නැති නමුදු - "ඉහල නිලධාරීන් සහ ජර්මානු ආන්ඩුව ඔහුගේ මේ දැඩි ක්‍රියාමාර්ගය අනුමත කරනු ඇති බවට හොඳ හේතු" ක්ලෙයින්ට තිබිනියි සිය ගවේෂනය පාදක කරගනිමින් *ඩර් ස්පීගල්* සඳහන් කරයි.

ඔගස්ට් හැනිං (අභ්‍යන්තර කටයුතු පිලිබඳ අමාත්‍යාංශය) සහ පීටර් විෂර්ට් (ආරක්ෂක අමාත්‍යාංශය) යන ලේකම්වරු දෙදෙන, ජර්මානු සොල්දාදුවන්ට එල්ල වන ප්‍රහාර උත්සන්න වීමෙන් අනතුරුව 2008 ඔක්තෝබර් 21 වැනි දින හමිඩ් කර්සායිගේ ආන්ඩුව මුනගැසීම පිනිස කාබුල් බලා සංචාරය කලෝ ය. බර්ලිනයට පෙරලා පැමිනි ඔවුහු චාන්සලර් කාර්යාලයෙහි සහ අභ්‍යන්තර කටයුතු, ආරක්ෂක හා විදේශ අමාත්‍යාංශවල නියෝජිතයින් සමග පෙරට යා යුත්තේ කෙසේ ද යන්න පිලිබඳ රහසිගත සාකච්ඡා පැවැත්වූහ.

*ඩර් ස්පීගල්* මේ සාකච්ඡා පිලිබඳ අදහස් දක්වයිඃ "හැනිං දැඩි අභිප්‍රායකින් යුක්ත ය, ඔහුට අවශ්‍යව ඇත්තේ තලිබානයට පිටුබල සපයන්නන් දඩයම් කිරීමට ය. දඩයම් කිරීමට හෝ දඩයමට ලක් කරවීමට, හැනිංට අනුව විකල්පය එය යි." මේ ආරම්භක රැස්වීමෙන් පසු එම කන්ඩායම ජර්මානු හමුදාවේ භූමිකාව වෙනසකට ලක් කිරීමක් තිරය පිටුපස සිට සංවිධානය කිරීම අරමුනු කරගත් වැඩිදුර සාකච්ඡා පවත්වා තිබේ. 2009 මැයි මස කේඑස්කේ ඒකක පලමු වරට තලිබාන් චෝදනා එල්ල වූවන් දඩයම ඇරඹී ය.

අප්‍රේල් මස නේටෝ මෙහෙයුම් සැලැස්මෙන් ජර්මානු බලකායන්ට ආත්මාරක්ෂාව සඳහා හැරුනු

විට "මාරක බලය පාවිච්චි කිරීම" වලක්වා ලූ එක් ව්‍යතිරේකයක් මකා දැම්මේ ය. ගිම්හානය තුල දී ඊට අනුරූපව විහිදුම ද වෙනස් කරනු ලැබී ය.

සෑම ජර්මානු සොල්දාදුවකු අත ම තිබෙන ඊනියා "පොකට් කාඩ්පත්"වලට සොල්දාදුවන්ට "ප්‍රහාර සැලසුම් කරන, සූදානම් කරන හෝ ඒවාට සහාය දක්වන පුද්ගලයින්ට හෝ වෙනත් ආකාරයක එදිරිවාදී හැසිරීමක් ප්‍රකට කරන අයට" එරෙහි ව මරනීය බලය සහිතව ප්‍රතික්‍රියා දැක්වීමේ ඉඩ ප්‍රදානය කෙරිනි.

ඉතා පුලුල් අරුත් දනවන "වෙනත් ආකාරවල එදිරිවාදී හැසිරීම්" යන්න ජර්මානු මිලිටරිය රැඳී සිටීම පිලිබඳ විරෝධතා දක්වන ඕනෑ ම කෙනෙකුට එරෙහි ව ජර්මානු සොල්දාදුවන්ට යොදාගනීමට ඉඩ සලසයි.

එහෙයින් සැප්තැම්බර් 4 වැනි දින කැරලිකරුවන්ට පහර දී "මූලෝත්පාටනය" කිරීමට නියෝගය දෙද්දී ඉහල නිලධාරීන්ගේ පිටුබලය තමා සතු ව පැවති බවට කර්නල් ක්ලෙයින්ට ඉතා නිවැරදි ආකාරයෙන් ඇඟැවිය හැකි විය.

දැනුවත් දියකරහැරීමේ පිලිවෙත යොදාගැනීමෙහි දී ජර්මානු හමුදාව ප්‍රාථමික නෛතික මූලධර්ම දරුනු ලෙස උල්ලංඝනය කරන්නා වූ නූතන විජිතවාදී යුද උපක්‍රමවලට ආවේනික විධික්‍රම කරා යමින් සිටියි. "ඉලක්කගත ඝාතන" ස්ථාපිත මිලිටරි පදයක් බවට පත් ව තිබේ. එම මාතෘකාව වෙනුවෙන් සම්පූර්න පොත් සහ නෛතික පත්‍රිකා ගනනාවක් ම කැප කෙරී ඇත. ගූගල්හි "ඉලක්කගත ඝාතන" පිලිබඳ සෙවුමක් මිලියනයකට අධික ප්‍රතිඵල ප්‍රමානයක් ජනනය කරයි.

එක්සත් ජනපදයේ වඩාත් ම වැදගත් විදේශ පිලිවෙත් බුද්ධි මන්ඩලය වන විදේශ සබඳතා කවුන්සිලයේ වෙබ් අඩවියෙහි පල වූ සම්ප්‍රදානයක එම පදය මෙසේ නිර්වචනය කරනු ලැබේ - "ඉලක්කගත ඝාතන ආන්ඩු විසින් තර්ජනයක් හැටියට දක්නා පුද්ගලයින් විනාශ කරදැමීම සඳහා භාවිත කෙරේ. සාමාන්‍ය වශයෙන් කියතොත්, කිසියම් ජාතියක බුද්ධි, ආරක්ෂක හෝ මිලිටරි බලකායන් එම ප්‍රශ්නයට තුඩු දුන් පුද්ගලයා හඳුනාගනු ලැබ ඔහු හෝ ඇය මරා දැමීම අරමුනු කරගත් මෙහෙයුමක් ක්‍රියාත්මක කරයි. ප්‍රශ්නකාරී වුව ද මේ භාවිතය ලොව වටා ආන්ඩුවල බුද්ධි හා ආරක්ෂක මෙහෙයුම් විසින් උපයෝගී කරගනු ලැබ ඇති අතර ඊනියා ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ ආරම්භයෙන් පසු ඉහල වලංගුභාවයකින් දැකගනු ලැබේ.

වෙනත් වචනවලින් කියතොත් "ඉලක්කගත ඝාතන" චෝදනා ඉදිරිපත් කිරීමකින් හෝ විනිශ්චයකින් තොර ව දේශපාලන විරුද්ධවාදීන් මරා දැමීම අරමුනු කරගනී. රහස් ඔත්තු සේවාවක් මගින් චෝදනා කරනු ලැබීම මරනීය දන්ඩනය නියම කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සෑහේ. කුන්දුස්හි යොදා ගැනුනු ඉලක්කයට නිශ්චිතව පහර වදින බෝම්බ, දුරස්ථ පාලක මිසයිල හා දුරස්ථ පාලක පුපුරන උපකරන - ආදී මේ සඳහා භාවිත කරන අවි ප්‍රහාරයට ගොදුරු වන්නවුන්ට (සහ ඔවුන් වටා සිටින්නන්ට) ආරක්ෂා වීමට කිසිදු ඉඩකඩක් නොසපයයි.

එවැනි විධික්‍රම අලුත් ඒවා නො වේ. එහෙත් දීර්ඝ කාලයක් තිස්සේ ඒවා ඒකාධිපති පාලන තන්ත්‍රයන්ගේ රහස් සේවාවන්ට අයත් දෑ සේ සලකනු ලැබී ය. නිදසුනක් වශයෙන් සෝවියට් රහස් ඔත්තු සේවය වූ ජීපීයූ ව විදේශයන්හි සිටි ස්ටැලින්ගේ විරුද්ධවාදීන් නිරන්තරයෙන් දඩයම් කොට මරාදැම්මේ ය. සීතල යුද සමයෙහි සීඅයිඒ සංවිධානය ද තෝරාගත් දේශපාලකයින් ඝාතනයේ යෙදුනු නමුත් පසුව - අඩු තරමේ නිල වශයෙන් වත් - එය අතහැර දැමීමට සිදු විය. 1981 දී ජනාධිපතිගේ විධායක නියෝගයක් මෙසේ ප්‍රකාශ කර සිටියේ ය - "එක්සත් ජනපද ආන්ඩුව විසින් සේවයෙහි යොදවනු ලැබූ හෝ එය වෙනුවෙන් ක්‍රියාත්මක වන කිසිදු පුද්ගලයෙක් ඝාතනවල නිරත වීම හෝ නිරත වීම සඳහා කුමන්ත්‍රනය කිරීම නොකල යුතු වන්නේ ය."

1980 ගනන් හා 1990 ගනන් ගතවෙද්දී මේ මාර්ගෝපදේශ වැඩිවැඩියෙන් අතහැර දමන ලදි. 1986 දී එක්සත් ජනපද ජනාධිපති රොනල්ඩ් රීගන් ට්‍රිපොලි හි ලිබියානු රාජ්‍ය නායක මුවම්මර් අල් ගඩාෆිගේ නිවසට මිසයිල ප්‍රහාරයක් එල්ල කිරීමට නියෝග කල අතර 1998 දී ජනාධිපති බිල් ක්ලින්ටන් ඇෆ්ඝනිස්ථානයේ ත්‍රස්ත කඳවුරක් සේ සැලකුන ස්ථානයකටත් සුඩානයේ කම්හලකටත් මිසයිල ප්‍රහාර එල්ල කිරීමට නියෝග දුන්නේ ය. බර්ලිනයෙහි එක්සත් ජනපද සොල්දාදුවන් ගැවසෙන ඩිස්කෝ ශාලාවකට බෝම්බ ගැසීම ගඩාෆිට එරෙහි ප්‍රහාරය සාධාරනීකරනය කල අතර කෙන්යාවේ හා ටැන්සානියාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලවලට එල්ල වූ ප්‍රහාර ක්ලින්ටන්ගේ නියෝගවලට තුඩු දුන්නේ ය.

ඊස්රායල ආන්ඩුව "ඉලක්කගත ඝාතන" පිලිවෙතෙහි පුරෝගාමියෙකි. 1970 ගනන්වල ම ඊස්රායල රහස් ඔත්තු සේවාව වූ මොසාඩ් සංවිධානය ත්‍රස්තවාදී චූදිතයින් දඩයම් කොට මරා දමා තිබින. එය සිය මෙහෙයුම් විශේෂ වශයෙන් පලස්තීන ජාතික ව්‍යාපාරයේ දේශපාලන නායකත්වයට එරෙහි ව ක්‍රියාත්මක කලේ ය. යසර් අරෆත්ගේ ෆාටාහ් සංවිධානයේ නායකයින් ගනනාවක් ම ඊස්රායල කොමාන්ඩෝ භටයින් විසින් ඝාතනය කරනු ලැබූහ. 1993 ඔස්ලෝ හි දී ෆාටා සංවිධානය ඊස්රායලය සමග එකඟත්වයට එලඹීමෙන් පසු හමාස් සංවිධානයෙහි මෙන් ම ලෙබනනයේ හෙස්බුල්ලා හා අමාල් සංවිධානවල නායකයෝ ද මොසාඩ් සංවිධානය විසින් ඉලක්ක කරගනු ලැබූහ.

*මිඩ්ල්ඊස්ට් ක්වාටර්ලි* හි පල වූ වාර්තාවකට අනුව 2000 සැප්තැම්බරයේ අල්ලාගත් ප්‍රදේශවල ආරම්භ වූ ඉන්ටිෆාඩා නැගිටීමෙහි පලමු මාස දොලහ තුල ඊශ්‍රායලය "අඩු තරමේ මධ්‍යම හා ඉහල තලයේ පලස්තීන ක්‍රියාකාරිකයින් හතලිහක් පමන" ඝාතනය කලේ ය. ඊශ්‍රායල සන්නද්ධ බලකාය ජනගහනය අධික ප්‍රදේශයන්හි මාර්ගවල වාහනවලට බෝම්බ ප්‍රහාර එල්ල කරමින් හෝ නිවාස විනාශ කරමින්, ඉලක්කගත පුද්ගලයින්ගේ පවුල් පිටින් මරාදමමින් අත්‍යන්ත මෘගභාවයෙන් යුක්ත ව පෙරට ගියේ ය. ඒවායේ අමූ නීතිවිරෝධීභාවය හේතුවෙන් ඊශ්‍රායල ඝාතන ජාත්‍යන්තර විවේචනයන්ට පාත්‍ර වී නමුත් තිරය පිටුපස ඊශ්‍රායල ආන්ඩුවට විශේෂයෙන් එක්සත් ජනපදයේ පිටුබලය මත රඳා පැවතිය හැකි විය.

2001 සැප්තැම්බර් 11 දින ප්‍රහාර, ඉලක්කගත ඝාතනවලට එරෙහි ව තිබූ සියලු සම්බාධක ඉවත හෙලීම සඳහා බුෂ් පාලන තන්ත්‍රය විසින් උපයෝගී කරගනු ලැබිනි. එවක පටන්, දේශපාලන විරුද්ධවාදීන් "ත්‍රස්තවාදී" හෝ "තලිබාන්" චෝදනා එල්ල කොට අමුඅමුවේ මරා දැමීම ඉරාකය හා ඇෆ්ඝනිස්ථානය අල්ලාගෙන සිටින ඇමෙරිකානු බලකායන්ට පොදු භාවිතයක් බවට පත් විය. එක්සත් ජනපද හෝ පාකිස්තාන ආන්ඩුවල විරුද්ධවාදීන් එක්සත් ජනපදය විසින් දුරස්ථ පාලිත යානාවල ඉලක්ක බවට පත් කරමින් මේ පිලිවෙත පාකිස්තානය තුලට ද දිගු කොට තිබේ.

බුෂ්ගේ අනුප්‍රාප්තික බරාක් ඔබාමා මේ පිලිවෙත අඛන්ඩව යොදාගත්තා පමනක් නො ව එය තීව්‍ර ද කොට තිබේ. නීතිය පිලිබඳ මහාචාර්ය කෙනත් ඇන්ඩර්සන් බෲක්ලින්ස් ආයතනය වෙනුවෙන් කල සම්ප්‍රදානයක මෙසේ ලියයි "බරාක් ඔබාමා යනු ඉලක්කගත ඝාතන සඳහා වූ දේශපාලන වේදිකාවක කොටසක් හැටියට ක්‍රියාත්මක වූ පලමු ජනාධිපතිවරයා බව කීම මඳක් අතිශයෝක්තියක් වෙයි. ඔහු ප්‍රශංසාත්මක ව මෙසේ එකතු කරයි - "ඉලක්කගත ඝාතනවල - එනම් කිසියම් පුද්ගලයකු වැඩිවැඩියෙන් උසස් තාක්ෂනය යොදාගන්මින් දුරස්ථ ව පාලනය කෙරෙන යානා මගින් ඝාතනය කිරීම - යෝග්‍යතාව අවධාරනය කිරීම සම්බන්ධයෙන් ඔබමා අපේක්ෂකයකු හැටියට නිවැරදි විය, ජනාධිපතිවරයකු හැටියට නිවැරදි විය. ත්‍රස්තවිරෝධී ප්‍රයත්නයෙහි අත්‍යවශ්‍ය, හස්තසාර හා තාක්ෂනික ව දියුනු අවශ්‍යතාවක් වශයෙන් ඉලක්කගත ඝාතන ඉදිරිපත් කිරීම වෙනුවෙන් වූ මූලෝපායික තර්කනය අතිබලගතු ය.

මෙම භාවිතය සාධාරනීකරනය කිරීමට ඉදිරිපත් වන පන්ඩිතයින්ගෙන් අඩුවක් නැතත් එය ප්‍රත්‍යක්ෂ වසයෙන් ම නීති විරෝධී වෙයි. එය ශිෂ්ටසම්පන්න රටවල් ගනාවක මරනීය දන්ඩනය අහෝසි කිරීම උල්ලංඝනය කරනවා පමනක් නොව එය වලංගු නඩු විභාගයකින් තොරව කිසිවෙකුත් මරනීය දන්ඩනයට පාත්‍ර නොකල යුතු බවට පිලිගැනෙන මූලධර්මය ද උල්ලංඝනය කරයි. ඉලක්කගත ඝාතන නීතිගත දෙයක් සේ සලකන කල්හි ඊට සීමාවක් නැත. ත්‍රස්තවාදියකු හා විමුක්ති සටන්කරුවකු අතර බෙදුම් රේඛාව ඇත්තේ කොහි ද? සුජාත හා අවජාත ප්‍රතිරෝධයක් අතර වෙනස කෙනෙකු නිර්නය කරගන්නේ කෙසේ ද? ඉලක්කගත ඝාතනවලට අවසර ඇත්තේ කුමන රටවල ද? එසේ නො වන්නේ කවර රටවල ද? මේවා ඇෆ්ඝනිස්ථානය, පාකිස්තානය, ඉරාකය, සුඩානය හා මෑතක දී යේමනය තුල පිලිගත හැකි බවට අධිරාජ්‍යවාදී ආන්ඩු විසින් පත් කරනු ලැබ තිබේ. මේ රේඛා ඇඳෙන අන්දම නිර්නය කෙරෙනුයේ ආක්‍රමනකාරී ආන්ඩුවල හිතුවක්කාර තීරන හා භූ-මූලෝපායික අවශ්‍යතා විසිනි.

මෙවැනි කොන්දේසි තුල, ජර්මානු හමුදාව ඉලක්කගත ඝාතන පිලිබඳ පිලිවෙතකට හැරීම අනතුරු සංඥාවක් නිකුත් කල යුතු වෙයි. ජර්මානු හමුදාව දෙවන ලෝක යුද්ධය තුල දී පෙරදිග පෙරමුනෙහි සිදු වූ තුච්ඡතම අපරාධවලට වගකිවයුතු විය. මියගිය ජර්මානු සොල්දාදුවන්ට හිලවු වශයෙන් එය සිවිල් ප්‍රාන ඇපකරුවන් දැවැන්ත සංඛ්‍යාවක් ඝාතනය කලේ ය, යුද්ධයෙහි පාර්ශ්වකරුවන් හා යුද සිරකරුවන් නඩු විභාගවලින් තොරව මරනීය දන්ඩනයට ලක් කලේ ය, තව ද යුදෙව්වන් මූලෝත්පාටනය කිරීමේ නිරත විය. එකල ජාත්‍යන්තර නීතිය මගින් ආවරනය නොකල බව කියැවුනු හෙයින් මේ අපරාධවලින් වැඩි කොටස ට දඬුවම් නියම නො වී පැවතින. කෙසේ වුව ද යුද්ධයෙන් පසු එවැනි විසකුරු ක්‍රියා නැවත සිදු වීම වලකනු පිනිස විධිවිධාන ගනනාවක් ජාත්‍යන්තර නීතියට හඳුන්වා දෙනු ලැබී ය. මේ විධිවිධාන දැන් බිඳ දැමෙමින් හා යටගැසෙමින් පවතී.

**පීටර් ෂ්වාර්ට්ස්**

© www.wsws.org